නුවරඑළිය මහා නගර සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූනි 13 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 23 දිනද විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 27 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

(අ). සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු අයවීම රු.20,348,142 ක් වුවද රු.19,582,142 ක් ණයගැතියන් බැරකර රු.766,000 ක් තැන්පතු ගිණුමට බැරකර තිබුණි. පසුව ගෙවිය යුතු මුද්දර බද්ද ලෙසට එම රු.766,000 ක් ගෙවා තිබුණු අතර එම ගෙවීමට අදාල මුදල් සභාවට ලැබී නොතිබුණි. මේ හේතුවෙන් මුද්දර ගාස්තු ආදායම් ණයගැතියන් රු.766,000 ක් වැඩියෙන් හා අයකරගතයුතු මුද්දර බදු ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කැරකෙන පුටු 10 ක වටිනාකම වූ රු.64,500ක් යන්ත්‍ර හා උපකරණ යටතේ දක්වා තිබුණු බැවින් එදිනට යන්ත්‍ර හා උපකරණ වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ලී බඩු හා සවිකිරීම් වටිනාකම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ.

(ඇ). සභාවට 2015 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙසට ලැබී තිබුණු කොමට්ෂු වර්ගයේ එක්ස්කැවේටර් යන්ත්‍රයේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ඉදිරියට ලැබුණු ජල ගාස්තු ජංගම වගකීම් යටතේ ගිණුම්ගත නොකර, එදිනට ලැබිය යුතු හිඟ ගාස්තුවලට හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එමෙන්ම ඉදිරියට ලැබුණු ජල ගාස්තු ප්‍රමාණය ගණනය කරද නොතිබුණි.

(ඉ). 2015 වර්ෂයේදී ප්‍රතිපූරණ පදනම මත ගෙවා තිබුණු රු.462,747 ක මැතිවරණ රාජකාරි ගෙවීම් මැතිවරණ කොමසාරිස් පසුව ප්‍රතිපූර්ණය කර තිබුණද එම මුදල ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමේ සහ ලැබිය යුතු ප්‍රතිපූරණ පදනම මත ගෙවීම් ගිණුමේ ශේෂය රු.462,747 බැගින් වැඩියෙන් දැක්වේ.

(ඊ). සභාවට අයත් සඳතැන්න ප්ලාස්ටික් සහ පොලිතීන් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් 2015 ඔක්තෝබර් 03 දින ලබාදී තිබුණු ප්ලාස්ටික් ඇඹරීමේ යන්ත්‍ර 02 ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකර හෝ බිල්පත් ඉදිරිපත්කර නොතිබුණු 2015 වර්ෂයට අදාල කර්මාන්ත 5 ක ඇස්තමේන්තුගත වියදම වූ රු.2,128,000 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් එම වටිනාකමින් වැඩියෙන්ද සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ). පෞද්ගලික බැංකුවක පවත්වාගෙන යන ජංගම බැංකු ගිණුමකට අදාලව 2015 වර්ෂය වෙනුවෙන් රු.10,960 ක් සහ 2016 වර්ෂය වෙනුවෙන් රු.11,213 ක් ලෙස අයකර තිබුණු එකතුව රු.22,173 ක් වූ බැංකු ගාස්තු, වියදම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි. එමෙන්ම මෙම බැංකු ගිණුමට සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස බැරවී තිබුණු රු.29,586 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 2 අතර කාල පරාසයක් ගතවී ඇති, ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව වූ රු.3,132,827 ක් අයකරගෙන නොතිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.60,021,736 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක් නිරවුල් කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.
-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.818,193 ක ගිණුම් විෂයයන් 03 ක් අදාල උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.
------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i). මු.රෙ. 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිමකළ වහාම පියවිය යුතු වුවද 2014 – 2016 කාලය තුළ අවස්ථා 23 කදී දෙන ලද රු.1,776,309 ක අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii). | මු.රෙ 371 (2) (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකිවන්නේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුවද සමාලෝචිත වර්ෂය තුලදී මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 16 කදී රු.4,431,647 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි. |
| (ආ). | භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලෙස එක් අවස්ථාවකදී ගෙවිය හැකි උපරිම මුදල රු.100,000 ක් වුවද අවස්ථා 3 කදී රු.873,261 ක මුදලක් එම සීමාව ඉක්මවා ලබාදී තිබුණි. |
| (ඇ). | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/ 22 දරන චක්‍රලේඛය. | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකලයුතු වුවද, 2007 වර්ෂයට පසු වරිපනම් බදු දේපළ තක්සේරු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.292,610,584 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.119,417,462 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.173,193,122 ක වර්ධනයක් සිදුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.173,193,122 ක වර්ධනයට ආදායම් විෂයයන් 6 ක ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.15,663,051 ක හිඟ කඩ කුලීවලින් වර්ෂය තුළ රු.4,907,552 ක් හෙවත් සියයට 31 ක් පමණක් අයකරගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.18,903,045 ක හිඟ කුලි හා ගාස්තු වලින් වර්ෂය තුළ රු.2,651,229 ක් හෙවත් සියයට 14 ක් පමණක් අයකර තිබුණි.

2.3.2 වරිපනම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.65,408,453 ක වරිපනම් බදු අයවිය යුතුව පැවතියද එම මුදල් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාරව අදාල කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින උසාවි දඩ රු.1,059,915 ක් හා මුද්දර ගාස්තු රු.23,923,690 ක් අයවිය යුතුව තිබුණි.

2.3.4 අධිභාර

මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 226 (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාරවලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.731,559 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). 2015 වර්ෂයේ මාස 07 ක් සඳහා මහා නගර සභාව සතු පොදු වැසිකිළි බදු දීම වෙනුවෙන් අයවිය යුතු රු.851,222 ක් අයකරගෙන නොතිබුණි.

(ආ). 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ නාගරික මන්ත්‍රීවරුන් 06 දෙනෙකුට සභා අරමුදල් වැයකර ලබාදී තිබුණු රු.429,720 ක් වටිනා ජංගම දුරකථන 10 ක් සභාවේ ධූර කාලය අවසන්වී ඇතත් ආපසු සභාවට ලබාගෙන නොතිබුණි.

(ඇ). සභා බලප්‍රදේශය තුළ කුලී රථ ලෙස ධාවනයකරන ත්‍රී රෝද රථවලින් ගාස්තු අයකරගැනීම හා නියාමනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන නොතිබුණි.

(ඈ). සභාවට අයත් හාවාඑළිය දෙණිය බැරැක්ලේන්හී පිහිටි අක්කර 08 රූඩ් 01 පර්චස් 07 ක ඉඩම් පෞද්ගලික ආයතනයකට බදුදීම වෙනුවෙන් 2015 ජූලි 31 සිට 2016 ඔක්තෝබර් 31 දක්වා වූ මාස 15 වෙනුවෙන් අයවිය යුතු රු.2,787,500 ක් අයකරගෙන නොතිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

-----------------------------------

(අ). 2016 ජනවාරි 29 දින ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම සඳහා රු.40,000ක අත්තිකාරම් මුදලක් නාගරික කොමසාරිස් වෙත ලබාදී තිබුණද 2017 අගෝස්තු 14 වන විටද එම යන්ත්‍ර ගබඩාවට ලැබී හෝ අත්තිකාරම් පියවා හෝ නොතිබුණි.

(ආ). සභාවට අයත් වික්ටෝරියා උද්‍යානයට කොන්ක්‍රීට් බංකු මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.100,000ක් හා සැපයුම්කරුට සෘජුව රු.86,880 ක් වශයෙන් රු.186,880 ක් ගෙවා තිබුණු අතර, ඉන් රු.86,880 ක් සඳහා බංකු 18 ක් මිලදීගෙන තිබුණි. එහෙත් රු.100,000 ක අත්තිකාරම පියවා නොතිබුණු අතර මිලදීගෙන තිබුණු බංකු වලින් රු.38,640 ක් වටිනා බංකු 08 ක් කැඩී තිබුණි.

(ඇ). වරෙන්තු ගාස්තු රු.464,949 ක් සහ බදු සහන රු.31,779 ක් ලෙසට පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.496,728 ක් විධිමත් අනුමැතියක් නොමැතිව කපාහැර තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

--------------------

(අ). 2015 ඔක්තෝබර් මස සභාව සතු වාහනයක ජනෙල් වීදුරුවක් බිඳී යාමෙන් සිදුවූ රු.127,000 ක හානිය සම්බන්ධයෙන් ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චයකර නොතිබුණි.

(ආ). ජනාධිපති ලේකම්ගේ 2015 ජූනි 05 දිනැති අංක සීඑස්ජ්/1/1/83 දරන ලිපිය මගින් පළාත් පාලන ආයතන අරමුදල් වැයකරමින් සිදුකරනු ලබන විදේශ සංචාර වහාම අත්හිටුවීමට ක්‍රියාකරන ලෙස දන්වා තිබුණද මහා නගර සභාවේ සභිකයින් 06 දෙනෙකු 2016 මැයි මස ජපානයේ පැවති නගර වැඩසටහනේ සංවත්සර උත්සවයකට සහභාගීකරවීම සඳහා සභා අරමුදලින් රු.918,825 ක් වැයකර තිබුණි.

(ඇ). අවශ්‍යතාව නිවැරදිව හඳුනාගැනීමකින් තොරව මිලදී ගැනීම් සිදුකිරීම හේතුවෙන් 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකක් රු.1,950 ක් මිලවූ රු.429,000 ක් වටිනා වැහිකබා 220 ක් ගබඩාවල ඉඩ ඇහිරීයාම වැළැක්වීම සඳහා 2017 වර්ෂයේදී රු.28,500 කට වෙන්දේසිකර තිබුණු බැවින් සභා අරමුදලට රු.400,500 ක පාඩුවක් සිදුවී තිබුණි.

3.4 පාරිසරික ගැටළු
--------------------

තැපැල් දෙපාර්තමේන්තුවේ සේවක නිවාස වැසිකිළි වල අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බාහිර පරිසරයට මුදාහරිමින් පැවතුණද, 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ X වැනි කොටසේ 01 සිට 10 වගන්ති ප්‍රකාරව එම තත්වය වැළැක්වීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූනි 13 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 07 ක සියයට 10 සිට සියයට 86 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 12 සිට සියයට 73 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ). ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර නොගැනීම |
| (ආ). ණයගැති/ ණයහිමි පාලනය | අයකරගතයුතු මුදල් අයකර නොගැනීම සහ ගෙවිය යුතු මුදල් නිරවුල් නොකිරීම |
| (ඇ). ගිණුම්කරණය | ආදායම් , වියදම්, වත්කම් සහ බැරකම් ගිණුම්ගත කිරීමේ විවිධ අඩුපාඩු පැවතීම |